# උභතෝකෝටික ඩයස්පෝරාව

අම්ජාඩ් මොහොමඩ් සලීම් විසිනි

වරෙක පිලිපීන කවියක මෙසේ සදහන්ව තිබුණි. වන්දනාකරු යළි සිට මව් රට බලා පැමිණෙයි, සමහර විටෙක ඔහු සිය මව් රටේ වෙරළ තීරයට ළගා වෙයි. නමුත් ඔහුට දැක ගැනීමට ඇත්තේ අයිස් සහ නෂ්ටාවශේෂ පමණි. තම ආදරණීයයන් සියලූ දෙනා සදහටම මෙලොවින් සමුගෙන ඇති අතර දිස් වන්නේ ඔවුන්ගේ සොහොන් කොත් පමණි. ඉවතට ගිය සංචාරකයා ඔබ ඔබේම රට තුළ තනි වූ අමුත්තෙකු වී ඇත. සතුටින් සිටින අනෙකුන්ට ගී ගයා විනෝද වීමට ඉඩ දෙන්න. නමුත් ඔබ ඉවත්ව ගොස් ඇත.

ඉතා දීර්ඝ කාලයක් සිය රටින් බැහැරව සිට හෝ පළමු වරට යළි ශ්‍රී ලංකාවට පැමිණීමට අපේක්ෂා කරන ලාංකිකයින් සදහා මෙය වඩා උචිත විස්තරයක් වේ. එසේම අනන්‍යතාවයට විවිධ ලේබල් ඇලවී තිබීම මෙම තත්ත්වය වඩාත් සංකීර්ණ බවට පත් කර තිබේ. දීර්ඝ කාලයක් පුරා මෙරටින් බැහැරව සිට යළි පැමිණෙන්නන් ආපසු පැමිණෙන්න් ලෙස වර්ගීකරණයකට භාජනය වී ඇත. උරුමයෙන් ශ්‍රී ලාංකික වුවත් ජාතිකත්වය සහ පදිංචිය වෙනස් වූ තැන ඔවුන්ගේ අභියෝගය ඇරඹෙයි.  ඔවුහු හදුන්වනු ලබන්නේ රටින් නෙරපා දැමුණු කණ්ඩායමක් හෝ ඩයස්පෝරාව ලෙසින්ද? මේ සෑම වචනයක් සදහාම නිශ්චිත අර්ථකථනයක් සහ ශාස්ත්‍රීය අර්ථයක් ඇත. කෙසේවෙතත් විශේෂයෙන්ම පසුකාලයේදී මෙම වචනය ගැටලූකාරී සහ විසංවාදී බවක් ගෙන තිබේ. ශ්‍රී ලාංකීය ජන සමාජය තුළ විශාල වශයෙන් ඩයස්පෝරාව යන්න සැක කටයුතු සහ අනර්ථකාරී බව නියෝජනය කරයි. වසර ගණනාවක් පුරා ශ්‍රී ලංකාවේ පැවති ගැටුම් සහ පශ්චාත් යුද වාතාවරණය පිළිබද ජාත්‍යන්තරයේ අවධානය හේතුවෙන් ඩයස්පෝරාව යනු රට විනාශ කිරීමේ ඒකායන අරමුණින් මාන බලන කණ්ඩායමකගේ ක්‍රියා කලාපයක් ලෙසින් අර්ථ ගැන්වී ඇත. මේ අනුව ඩයස්පෝරාව යනු ශ්‍රී ලංකාවේ ආරක්ෂාවට ඇති තර්ජනයකත් ලෙසින් ඩයස්පෝරාව සැලකේ.

ශ්‍රී ලංකාව තුළදී ඩයස්පෝරාව යන වචනය භාවිත කරමින් සංවාදයේ යෙදීම මේ නිසාවෙන්ම ඉතා බැරෑරුම් කටයුත්තක් වී ඇත. සරලවම එය වැදගත්කමක් ඇති දෙයක් නොවේ. මෙම ප්‍රජාවට අයත් කිසියම් පුද්ගලයෙකු මෙරටට පැමිණියහොත් ඩයස්පෝරාවේ සාමාජිකයින් වෙත පටබැදී ඇති ගැටුම්කාරී අනාරක්ෂිත බවේ ස්වභාවය එම පුද්ගලයාට ද ආරූඪ කෙරේ. ඔබට දැකගැනීමට හැකි ආකාරයට අප වැනි බොහෝ දෙනෙකු වෙනත් රටක ඉපිද හැදී වැඩී එරට පුරවැසිභාවය සහ ජාතිකත්වය දැරුව ද අප ශ්‍රී ලාංකික සංස්කෘතිය සහ ආගමික පරිසරයක් තුළ හැදී වැඩුනෙමු. අපගේ උරුමය සහ සාරධර්ම ගිලිහී යාමට ඉඩ නොදී රැක ගැනීම සදහා අපගේ දෙමව්පියන් තම සීමාවන් අභිබවා යමින් ශ්‍රී ලාංකිකත්වය ආරක්ෂා කරගැනීමට බොහෝ දේ සිදු කර තිබේ.  රොමේෂ් රංගනාදන් සමග 'Asian Provocateur' කතා මාලවේ අවම අනුවාදයක් ඔහුගේ මවගේ එම දෘෂ්ටියෙන් මවාගන්න. අප බොහෝ දෙනෙකු හැදී වැඩී ඇත්තේ මෙවැනි බොහෝ බෙදීම් සමගිනි. අප ශ්‍රී ලංකාවේ ජීවත් වෙන්නේ අපගේ දෙමව්පියන් ලැබූ අත්දැකීම් සහ ඔවුන්ගේ දෘෂ්ටි කෝණයන් හරහාය. ( වෛරී ස්වභාවයට එරෙහි වන තැනක හෝ කිසිවක් නොවන තැනකට මිනිසුන් පත් වන අවස්ථා මත තීරණය වන).

මේ අනුව ඩයස්පෝරාවේ දෙවෙනි හෝ තෙවෙනි පරපුරේ අපට මේ අනන්‍යතාව සහ එහි අරුත සෙවීම රැකියා නියුක්තියට වඩා වැදගත්වන බලාපොරොත්තුවක් බවට පත්ව ඇත. අප කොතැන සිටින්නේදැයි නොදනිමු. අප අයත් බව සොයන්නෙමු. ඩයස්පෝරාවේ සන්දර්භය තුළ තමන්ගේ අයත්බව පිළිබඳ මිනිසුන්ගේ හැඟීම සැමදා පවතින අතර තමන් දිවි ගෙවන සංස්කෘතික වටපිටාව සමග කෙරෙන නිරන්තර ගණුදෙනුවේදී මතුවෙයි. ඒ අනුව අලුත් නවාතැනක් සාදාගැනීම යනු සුහදතාව සහ ඉවසීම පවත්වාගැනීම පමණක් නොව ගැටීම සහ බැහැර කිරීමට ද අදාළ කරුණකි. අත්‍යන්තයෙන් ම අපගේ ජාතිකත්වය පවතින රටවලට සැබවින්ම අප නොගැලපේ. මන්ද යත් සංස්කෘතික, ආගමික භාවිතය, ආහාර, ඇඳුම් පැළඳුම් පමණක් නොව වර්ණය අතින් ද වෙනස්කම් ඇත. අනෙක් අතින් ගත්විට අපගේ උරුමය ඇති රටට ද අප පූර්ණ වශයෙන් නොගැලපේ. මන්දයත්, අපේ කතා විලාසය වෙනස්. ඒ අනුව එය වෙනස් ව දකින අතර නරකම තත්ත්වයක දී සතුරනී ලෙස හෝ හොඳ අවස්ථාවල දී වෙනසී යනුවෙන් හංවඩු ගැසෙන බැවිනි. මේ දෙආකාර වර්ගීකරණය බොහෝ ආකාරයෙන් හඳුනාගත හැක. මේ අයත්බව පිළිබඳ සංකල්පයෙන් යථාර්ථ වූ හෝ කල්පිතයක් වූ සිය නිජබිමට, තමන් පැවත එන ස්ථානයට ඇති හැඟිම්බර බැඳීම මතුකරයි. එයින් හැඟිම් සහ ක්‍රියාවන් හි යෙදෙන ිකල්පිතී ප්‍රජාවක් අප විසින් නිර්මාණය කරනු ලබයි.

මෙම ප්‍රජාවන් නිර්මාණය වීමේදී, අප විසින් පහ කර හැරිය යුතු වන ඇතැම් මිත්‍යාවන් ද ගොඩනැගේ. උදාහරණයක් ලෙස ගතහොත් ඩයස්පෝරාව ගැන මතුවන මිත්‍යා කෙසේ හෝ එකිනෙක ගැලපෙන ඒවා වේ. පරම්පරා අතර පවතින බෙදීම් ප්‍රජාව තුළම සහ ප්‍රජාවන් අතර පවතින බෙදීම් ඉක්මවා යයි. තමන්ගේ උරුමය ඇති රට මෙන් ම සිය නේවාසික රට සමග බහුවිධ සබඳතා ඇති නමුදු බොහෝ දේශපාලනික මත සහ අත්දැකීම් නියෝජනයේදී ස්වභාවයෙන් ම එකිනෙක ගැලපීමක් දැකීම විරලය.

ඩයස්පෝරා ප්‍රජාවන් සැමවිටම ක්‍රියාකරනුයේ තමන් සමග සිටින ප්‍රජාව වෙනුවෙනි. කෙසේවෙතත්, මෙම ප්‍රජාවන් සමග ඔවුන්ගේ ඇති සංවාදශීලීත්යෙන් බොහෝවිට පූර්ණ යථාර්ථය නියෝජනය නොකෙරෙන අතර තමන්ගේ ම වාර්ගික කණ්ඩායමට පමණක් සීමා වේ.

ශ්‍රී ලංකාව සමග ඩයස්පෝරා ප්‍රජාව ක්‍රියා කිරීම සම්බන්ධ කවර හෝ සංකච්ඡාවකට එළැඹේදී(පුළුල් අර්ථයෙන් ගතහොත් වාර්ගික, ආගමික සහ දේශපාලනික සබඳතා පිළිබඳව) මෙය ආරම්භක කරුණ විය යුතුය. ශ්‍රී ලංකාවේ ගැටලු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ඩයස්පෝරා ප්‍රජාවන් ක්‍රියාකාරීවන තාක්, සාමය ගොඩනැගීම, සංහිඳියාව සහ යළිගොඩනැගීම සඳහා මෙම පෙළඹවීම මුසු කිරීමේ අවස්ථා සුලබව ඇත. කෙසේ හෝ අතීතයේදී, ශ්‍රී ලාංකික ඩයස්පෝරා ප්‍රජාවේ සාමාජිකයින් සමග පවත්වාගත යුතු වූ අත්‍යවශ්‍ය වූද එක්ව කළයුතු වූද ඉලක්කගත ක්‍රියාකාරකම් වඩාත් ම අණ්ඩ දැමීමේ පියවරක් ලෙස පෙණින. මෙයින් බොහෝමයකින්ම පෙනෙන්නට වූයේ, විශාල වශයෙන් ම බලපෑම් හැකියාවෙන් යුතු දේමළ ඩයස්පෝරාවේ පීඩනය මත නැගඑන බව පෙනෙන්නට වූ , මානව හිමිකම් ආදී දේ සම්බන්ධ ජාත්‍යන්තර විවේචන වෙනතක හැරවීම සඳහා වූ පසුගිය රජයන්ගේ ප්‍රතිචාරාත්මක ආවේගයන් ලෙසය. මෙය වෙනස් කිරීම සඳහා නව රජය සපථ කළේ යළි සංවර්ධනය සහ සංහිඳියාව පිළිබඳ ප්‍රයත්නයට උනන්දුවක් දක්වන විදෙස් රටවල ජීවත්වන කණ්ඩායම් සමග සාකච්ඡා කරමින් සහ ඔවුන් උනන්දු කරමින් ය.

දිගු කාලයක් පුරා, කිසිවක් කළ නොහැකි හෝ කරන්නට නොහැකි වන පරිදි කොන් කිරීමට සහ කණස්සල්ලට ලක්ව සිටි ඩයස්පෝරාවේ අපි මේ පියවර අගය කරන්නෙමු. ඩයස්පෝරාව සමග ගණුදෙනු කිරීමේදී රජය සැලකිල්ලට ගත යුතු කරුණු කිහිපයක් ඇත.

1) ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ඩයස්පෝරා ප්‍රජාව තුළ ඇති බහු විධ දුක්ගැනවිලි අවබෝධ කරගැනීම. මෙම ප්‍රජාවන් ශ්‍රී ලංකාවෙන් බැහැරට සංක්‍රමණය වූයේ විවිධ හේතු (සිය කැමැත්තෙන් හෝ අකමැත්තෙන්) පාදක කරගනිමිනි. ඔවුන් හැර ආ රට ගැන එකිනෙකාට වෙනස් වූ අදහස් හා දුක්ගැනවිලි පවතී. ඔවුන් සමග සාකච්ඡා කිරීමට පෙර මෙය අවබෝධ කරගැනීම සහ පිළිගැනීම අවශ්‍යය.

2) සංකීර්ණ බහුවිධ ඩයස්පෝරා ප්‍රජාවන් සහ සිය උරුමය සහිත රට සම්බන්ධයෙන් ඔවුන් තුළ ඇති අනේකවිධ අදහස් නියෝජනය කරන ගතික භාවයන් අවබෝධකර ගැනීම. ඩයස්පෝරා ප්‍රජාවන් ඔවුන්ගේ අදහස් සහ අත්දැකීම් නියෝජනය කරතත්, අද දවසේ දී සිය උරුමය ඇති රටතුළ ජීවත්වන ප්‍රජාවන්ගේ, සිවිල් සමාජයේ සහ දේශපාලන සමාජයේ අදහස් සහ අත්දැකීම් නියෝජනය නොකරයි. එසේ වුවද, සිය උරුමය සහිත රට සමග විශේෂ සබඳතා මෙන් ම දේශපාලන, ආර්ථික හෝ සංවර්ධනාත්මක (මානව සහ වෙනත් ආකාරයේ) කටයුතුවලට සුවිශේෂී බලපෑමක් කිරීමේ හැකියාවෙන් ද යුක්තය.

3) වෙනස් පෞද්ගලික අභියෝග සහ පෙළඹවීම් සහිත වූ එකම පවුලේ වුවද විවිධ පරම්පරා අතර පවතින, අත්දැකීම්, ආකල්ප සහ පෙළඹවීම් පිළිබඳ පරම්පරා අතර වෙනස හඳුනාගැනීම.

4) ශ්‍රී ලංකාවේ පවතින තත්ත්වයට වඩා, බොහෝ ඩයස්පෝරා ප්‍රජාවන් වඩාත් ධ්‍රැවීකරණය වී (ඇදහිලි තුළ සහ ජාතීන් අතර ) ඇත. අවංක සහ ඵලදායී සංවාදයක් ඇතිවීම සඳහා මේ බෙදීම සහ අවස්ථා හඳුනාගැනීම අනිවාර්ය වේ.

5) අදාළ ප්‍රජාවන්ගේ සැබෑ අවශ්‍යතා, පරතර සහ පෙළඹවීම් පිළිබඳ අවබෝධය ගොඩනැගීම සහ සෑම ප්‍රජාවක් සම්බන්ධ උපකල්පන නිවැරදි කිරීම සංවාදය සඳහා ඉතා වැදගත් තීරණාත්මක ආරම්භයකි. මෙයින්, ඩයස්පෝරාව වෙත වඩා පුළුල් යථාර්ථයක් පිරිනැමීමේ අවස්ථාවක් සම්පාදනය කරයි.

6) ඩයස්පෝරාවේ මානයෙන් ශ්‍රී ලංකාව පිළිබඳ දැක්ම වෙනස් වන්නා සේම ශ්‍රී ලංකාවේ මානයෙන් ද ඩයසපෝරාව පිළිබඳ දැක්ම වෙනස් ය. ශ්‍රී ලංකාව තුළ ඩයස්පෝරාව පිළිබඳ පැහැදිලි බවක් ඇතිවිය යුතු අතර ඔවුන් පිළිබඳ මිථ්‍යාවන් පහ කළ යුතුය. මව් රටේ සිවිල් සමාජය, ප්‍රතිපත්ති සම්පාදකයින් සහ ඩයස්පෝරා ප්‍රජාවන් අතර සංවාදයට වඩා විවෘත සහ අන්තර්ගත ඉඩකඩක් තිබිය යුතු අතර ඩයස්පෝරා ප්‍රජාවන් සහ දේශීය ප්‍රජාවන් අතර සබඳතා තහවුරු කිරීමට අමතරව ඩයස්පෝරා ප්‍රජාවන් වර්ධනය සහ ප්‍රවර්ධනය කිරීම අවශ්‍යය.

ඩයස්පෝරාවේ ජනතාවට ඉතා පහසුවෙන් අනුගමනය කල හැකි පියවර වන්නේ ශ්‍රී ලංකාව ඉතා නරකම තැනක සිටින විට ඒ සම්බන්ධයෙන් ක්‍රියා කිරීම හෝ ක්‍රියා නොකිරීම සහ ඒ සඳහා බලහත්කාරයෙන් සම්පූර්ණයෙන් ඈද දැමීමය. අසීරු තත්ත්වය වන්නේ අභියෝග සහ අසාර්ථක තත්ත්වයන් හඳුනාගැනීම

වුවත්, සාර්ථකත්වය සඳහා ඇති හැකියාවන් හඳුනාගනී. යළි ශ්‍රී ලංකාවට පැමිණ අපගේ දෙමාපියන්ගේ උරුමය ඇති රටට යමක් යළි පිරිනැමීමට තීරණය කළ මා වැනි බොහෝ ඩයස්පෝරාවට ඇති උභතෝකෝටික කාරණය මෙය ය. මෙරට ජීවන තත්ත්වය වෙනුවට අප බොහෝ දෙනා වෙනත් රටවල ජීවන තත්ත්වය සඳහා වෙනස් වීමට (ඇතැම් විට විශාල වැයකිරීමකින්) තීරණය කරන්නේ අන් කිසිවක් නිසා නොව කිසියම් දායකත්වයක් දැරීම සඳහා උත්සහ දැරීමට අපට උපකාරීවන අවස්ථා හේතුවෙනි. මා සිතන හැටියට මෙය අන්‍යොන්‍ය වශයෙන් ප්‍රතිලාභ සහිත හවුල්කාරීත්වයක් ගොඩනගාගැනීමේ අපේක්ෂාව සහ අවස්ථාව සහිතවූ තත්ත්වයකි. ඩයස්පෝරාවට අයත් අප බොහෝ දෙනාට අයත්වීම අවශ්‍යය. සියලූ ආකාරයේ වෙනස්කම් අතරේ වුවද අප අත්දකින පොදු තත්ත්වයකි. එසේ අයත්වීමේ අවශ්‍යතාව වෙනුවෙන් අපගේ හැකියාවන්, දැනුම සහ අපගේ මුදල් ද සම්පාදනය කරන්නෙමු. පොදු අනාගතයක් ගොඩනැගීමේ සිය ගමන සඳහා මෙයින් ප්‍රතිලාභ අත්කරගැනීමට ශ්‍රී ලංකාවට හැකිය.

(දකුණු ආසියාතික ගැටලූ සම්බන්ධයෙන් (ශ්‍රී ලංකාව පිළිබඳ ප්‍රධාන වශයෙන් අවධානය යොමු කළද ඒ වෙනුවෙන් ම නොවන) දේශපාලන විශ්ලේෂකයකු වන අම්ජාඩ්, මානුෂීය සහ සංවර්ධනය ගැටලූ, සාමය ගොඩනැගීම සහ අන්තර් ඇදහිල් සංවාදය පිළිබඳ විශේෂඥතාවක් හොබවන්නෙකි. දැනට International Alert ආයතනයේ මෙරට අධ්‍යක්ෂවරයාවන ඔහු ලන්ඩනය පාදක කරගත් 21වෙනි සියවසේ අධ්‍යයනය නම් ව්‍යාපෘතියේ ගෝලීය සාමාජිකයෙකි.)